# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/6 - 2019 අගෝස්තු මස 26 වැනි සඳුදා - 2019.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාත

ඇමුණුම් අංක 01

2018.08.29 දිනැති අංක 2086/15 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති සංශෝධනය කිරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය, මහ නගර සභා ආඥාපනතෙහි 289(1) වගන්තියෙන් විෂයභාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(1)(ඇ)(ඉ)(ඊ) උපවගන්තිවල විෂයභාර අමාත්‍යවරයාට හිමි බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.08.29 දිනැති හා අංක 2086/15 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රීති පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට නියෝග මෙයින් පනවනු ලැබේ.

මෙම නියෝග 2019 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

සරත් ඒකනායක,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2019 මාර්තු මස 28 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1. මහ නගර සභා ගරු නගරාධිපතිවරුන් හා නියෝජ්‍ය නගරාධිපතිවරුන් සඳහා සංග්‍රහ දීමනා හා සංග්‍රහ වියදම්

*දැනට තිබෙන පිළිවෙල* :

3.I මහ නගර සභා නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 3000 ක දීමනාවක් සඳහා සභා අරමුදලින් වියදම් කළ හැකි ය. ඒ සඳහා වන වැය විෂය ඉදිරිපත් කළ යුතු වේ.

3.II මහ නගර සභා නියෝජ්‍ය නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 750.00 ක දීමනාව සභා අරමුදලින් වියදම් කළ හැකිය. ඒ සඳහා වැය විෂය ඉදිරිපත් කළ යුතු ය.

1A - PG 4587 — 20 (2019/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.III මහ නගර සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගිවන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගිවන එක් සභිකවරයෙකුට එක් රැස්වීමකට රුපියල් 100.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

*සංශෝධනය විය යුතු ආකාරය*

3.I මහ නගර සභා නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 5000.00 ක මුදල උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් කළ හැකිය.

3.II මහ නගර සභා නියෝජ්‍ය නගරාධිපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 3000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් කළ හැකිය.

3.III මහ නගර සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගිවන එක් සභිකයෙකුට එක් රැස්වීමකට රුපියල් 200.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

02. ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන් සහ සභිකවරුන් සඳහා සංග්‍රහ දීමනා හා සංග්‍රහ වියදම්

*දැනට තිබෙන පිළිවෙල*

3.I ප්‍රාදේශීය සභා සභාපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 2000.00ක දීමනාව සභා අරමුදලින් වියදම් කල හැකිය. ඒ සඳහා වන වැය විෂයය ඉදිරිපත් කළ යුතු ය.

3.II ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගී වන සභිකවරුන්ට සංග්‍රහ කිරීම සඳහා සහභාගි වන එක් සභිකවරයෙකුට එක් රැස්වීමකට රුපියල් 100.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

*සංශෝධනය විය යුතු ආකාරය :*

3.I ප්‍රාදේශීය සභා සභාපතිවරුන් වෙත සංග්‍රහ දීමනා වශයෙන් මාසිකව රුපියල් 4000.00ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දරිය හැක.

3.II ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් හා කමිටු රැස්වීම්වලට සහභාගී වන එක් සභිකයෙකුට එක් රැස්වීමකට රුපියල් 200.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිය හැකිය.

3. ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩල දීමනා

*දැනට තිබෙන පිළිවෙල*

6.I ප්‍රාදේශීය සභා සභාපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත් කර ගත හැකි අතර ඔහුට දීමනා වශයෙන් රුපියල් 7500.00ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දරිය හැකිය.

*සංශෝධනය විය යුතු ආකාරය*

6.I ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත් කර ගත හැකි අතර පෞද්ගලික ලේකම්වරයාට දීමනා වශයෙන් මසකට රුපියල් 12,500.00ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දරිය හැකිය.

09 - 729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.